යම් කිසි පුවතකට ඍජුවම අදාළ නොවන ඍණාත්මක සන්දර්භයන් තුළ පවා වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් ඉස්මතු කොට දැක්වීම ඔස්සේ පැන නගිනා ප්‍රධානතම ගැටළුවක් වන්නේ, ඒ ඔස්සේ එම වාර්ගිකත්වයන් හෝ ආගමිකත්වයන් ඍණාත්මක ලෙසින් ඒකාකෘතික වීම, එසේත් නැතිනම් පාඨක ප්‍රජාව එම වාර්ගිකත්වය හෝ ආගමිකත්වයන් ඍණාත්මක ඇසකින් දැකීමට පෙළඹීමයි. මාධ්‍ය ආචාර ධර්ම තුළ පවා අදාළ නොවන තන්හි වාර්ගිකත්වයන්, ආගමිකත්වයන් ඉස්මතු කොට නොදක්වන ලෙසින් පවසන්නේ ඒ හෙයිනි.

"සෙල්ලකාර ජීවිතයක ගමන අවසන් කළ පලිගැනීම" යන සිරස්තලය සමගින් ඉරිදා ලංකාදීප පුවත්පතේ (ජූනි 19, 2022) පළවූ ලිපියක් ඔස්සේ වාර්තා වී තිබුණේ අනුරාධපුර සිදුවූ ද්විත්ව ඝාතනයකි. මෙම සිදුවීම පිළිබඳව ආවරණය කොට ඇති මෙම ලිපිය තුළ තැන් ගණනාවක "මුස්ලිම්" ලෙසින් ඊට අදාළ එක් අයෙකුගේ වාර්ගිකත්වය දැක්වී තිබිණි. එසේම මෙම සිදුවීමට අදාළ අයගේ නම් ද ලිපිය තුළ සඳහන්ව තිබුණු නමුත්, මෙහි වාර්ගිකත්වයක් ලෙසින් සඳහන් වී තිබුණේ "මුස්ලිම්" යන්න පමණි.
එසේ නම්,

1) මෙම සිදුවීමට අදාළ එක් අයෙකුගේ පමණක් වාර්ගිකත්වය "මුස්ලිම්" යනුවෙන් ලිපියේ සඳහන් කර ඇත්තේ මන්ද?

2) එම "මුස්ලිම්" යන වාර්ගිකත්වයෙන් හඳුන්වා දී ඇති අයගේ නම් මෙන්ම තවත් අදාළ අයගේ නම්ද සඳහන්ව ලිපිය තුළ තිබුණත්, වෙනත් කිසිම අයෙකුගේ වාර්ගිකත්වයක් ලිපියේ දැක්වී නොමැත්තේ මන්ද?

3) එම සඳහන් තැනැත්තාගේ "මුස්ලිම්" වාර්ගිකත්වය පුවතට අදාළ වන්නේ කෙසේද?

අදාළ නොවේ නම් වාර්ගිකත්වයන් ඉස්මතු නොකරමු!